(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 14]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0038/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2002 ජූනි මස 30 වැනි දින සිට 2007 ජූනි 30 දක්වා කාලය තුළ විවිධ ක්‍රියාකාරකම් සඳහා සෙස් බද්ද මගින් එකතු කර ගන්නා ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් නිශ්චිත ක්‍රියාකාරකම හා මුදල් ප්‍රමාණය කවරේද; සහ

(iii) සංචාරක, ධීවර කටයුතු, තේ, පොල්, රබර් හා ඉස්සන් ඇති කිරීම යන කර්මාන්ත වලින් එකතු කරගත් සෙස් බදු ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෙස් බදු මගින් එකතු කර ගන්නා ලද මුදල් එක් එක් ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශය වෙත යැවූ දිනය; හා

(ii) පසුගිය වසර 05 තුළ එලෙස යවන ලද මුදල් ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0039/'08

2.

ගරු රවි කරුණානායක මහතා,—වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ඉදි කරමින් පවතින්නේද;

(ii) එසේ නම් පරිසර බලපෑම් තක්සේරු වාර්තා, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණ වාර්තා සහ ශක්‍යතා වාර්තා අනුමත කොට ඉදිරිපත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් වාර්තා තුන එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) නැවත පදිංචි කරවීමට සිටින පුද්ගලයන්ට ගෙවීමට එකඟ වී ඇති වන්දි මුදල කොපමණද;

(ii) සියලුම නම්වල ලැයිස්තුවක් සමග එම සම්පූර්ණ පුද්ගලයන් සංඛ්‍යාව සහ ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණය;

එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මුල් ගල තැබූ දිනය හා එහි වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන දිනය කුමක්ද;

(ii) මෙම ගුවන් තොටුපලට පැමිණීමට එකඟත්වය පළකර ඇති ගුවන් සේවා කවරේද;

(iii) ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම (IATA) එයට එකඟත්වය හා අනුමතිය දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) (i) එම ගුවන් තොටුපල රජය සතුකර ගැනීමට යන්නේද;

(ii) වැය කිරීමට බලාපොරොත්තු වන මුදල හා එම මුදල් යොදවන්නේ කවුරුන්ද;

(iii) ණය ලබා ගැනීමේ නියෝග හා කොන්දේසි කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0040/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකවරුන් හා අමාත්‍යවරුන් විසින් 2006 ජනවාරි 01 වැනි දින සිට 2007 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ භාවිතා කරන ලද හෙලිකොප්ටර් සඳහා රජය විසින් වැය කරන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකවරුන් සහ අමාත්‍යවරුන් ඉහත සඳහන් කරුණ වෙනුවෙන් වැය කරන ලද මුදල සවිස්තරාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයට කිසිදු වියදමක් දැරීමට නොමැතිව ගුවන් හමුදා හෙලිකොප්ටර් භාවිතා කර තිබේද;

(ii) අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමා හැර හෙලිකොප්ටර් භාවිතා කළ අනෙක් පුද්ගලයන්ගේ නම් හා භාවිතා කරන ලද වාර ගණන කොපමණද;

(iii) ඉහත සඳහන් පුද්ගලයින් සඳහා පෞද්ගලික සමාගම්වලට අයත් හෙලිකොප්ටර් භාවිතා කර තිබේද; සහ

(iv) එසේ නම්, පුද්ගලයාගේ නම හා වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0131/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර විශ්‍රාම යන අයකුට විශ්‍රාම වැටුප් හිමිවීමට නම් සේවක අර්ථසාධක අරමුදලට මාස 240 ක අඛණ්ඩ දායකත්වයක් තිබිය යුතු බවත්;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා වයස අවුරුදු 40 - 45 අතර අයද සේවයට බඳවා ගෙන ඇති බවත්;

(iii) ඔවුනට මාස 240 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට හැකියාව නොමැති බවත්;

(iv) සේවක අර්ථසාධක අරමුදලට වැටුපෙන් දායක වුවද, ඉහත හේතුව මත විශ්‍රාම වැටුප නොලැබ පීඩාවට පත්ව 50 ට අඩු පිරිසක් සිටින බවත්;

(v) මොවුන්ගේ විශ්‍රාම වැටුප ලබාගැනීමට සහන ඉල්ලා සිටිය ද මෙතෙක් එය ඉටුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 60 න් විශ්‍රාම ලබා කොන්ත්‍රාත් පදනම මත සේවය කළ කාලපරිච්ඡේදයත් එකතුකර විශ්‍රාම වැටුපට හිමිකම් ලැබූ නිලධාරීන් 6 දෙනෙක් සිටින බවත්;

(ii) සේවක අර්ථසාධක අරමුදලට දායක නොවූ අවුරුද්දකට වැඩි කාලසීමාවක් එකතුකර එක් අයෙකුට විශ්‍රාම වැටුප් ගෙවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) වයස අවුරුදු 45 ට අඩු කාලය සලකා සේවය සම්පූර්ණ කළයුතු විශේෂිතම තනතුරු සඳහා බඳවාගත් මේ අයට විශ්‍රාම වැටුප් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0132/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) දැනට නො: 107/ඒ2, වීර උදිත මාවත, හැඩිගම, පිළියන්දල ලිපිනයෙහි පදිංචි එච්. ජී. චන්ද්‍රදාස මහතා, මාතර පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිව සිටි බවත්;

(ii) 2003 වසරේ ගංවතුර හා නායයෑම් හේතුවෙන් ඔහුගේ නිවස විනාශ වූ බවත්;

(iii) ඒ වෙනුවෙන් රු. 15,000/- ක මුදලක් පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දුන් බවත්;

(iv) රු. 85,000/- ඉතිරි මුදල ඔහුට ලබා දිය යුතුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉතිරි මුදල ලබා දිය යුතු බවට මාතර දිස්ත්‍රික් ලේකම් විසින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බවත්;

(ii) අවශ්‍ය පියවර ගැනීමට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පියවර ගත යුතු බවත්;

(iii) මුදල් ලබා ගැනීමට චන්ද්‍රදාස මහතා අවස්ථා කිහිපයකදී ඉදිරිපත් වී ඇති නමුත් විසඳුමක් ලැබී නැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත හිඟ මුදල ලබා දීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0133/'08

6.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ 2008 වර්ෂය වෙනුවෙන් පළාත් මාර්ග කි.මී. 2400 ක් සංවර්ධනය සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තර ඉංජිනේරු සැලසුම් සකස් කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේනම් එකී මාර්ග කවරේද;

(ii) එම එක් එක් මාර්ග සඳහා මුදල් වෙන්කර තිබේද;

(iii) මුදල් වෙන් කිරීමට අදාළ අමාත්‍යාංශය මැදිහත් වන්නේ කෙසේද;

(iv) පාරවල් පුළුල් කිරීමක් සිදුවන්නේ නම්, ඉඩම් අත්පත් කර ගැනීමට මුදල් යොදවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

0365/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැකුළන්දල උතුර වසමේ සමෘද්ධි සහනාධාරලාභීන් කවුරුන්ද; සහ

(ii) ඒ අතුරින් 2005 – 2006 – 2007 වසරවල ළිං ආධාර සහ වැසිකිලි ආධාර ලබාගත් අය කවුරුන්ද;

යන්න නම් වශයෙන් විස්තර සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0366/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2002 වර්ෂයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරිවරුන් බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම තරඟ විභාගයෙන්, මනම්පිටිය, මාදුරුඔය හන්දිය ලිපිනයෙහි පදිංචි විරාජ් කහගල්ල මහතා සමත්වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තරඟ විභාගයෙන් සමත් වූ 04 දෙනෙකුට පමණක් 2007 වර්ෂයේදී පත්වීම් ලබා දී ඉතිරිව ඇති පුරප්පාඩු 15 ක් සඳහා නැවත තරඟ විභාගයක් පැවැත්වීමට හේතු වූ කරුණු කවරේද; සහ

(ii) සියලුම සුදුසුකම් සපුරා තරඟ විභාගයෙන්ද සමත් ව ඇති විරාජ් කහගල්ල මහතාට අදාළ පත්වීම ලබානොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) විරාජ් කහගල්ල මහතාට ඉහත පත්වීම ලබාදීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්බලන්තොට පහල බැරගම නින්දගම් ප්‍රදේශවල ඉඩම් අහිමිවූවන්ගේ සමිතිය මගින් වලව වම් ඉවුර සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉඩම් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අයට ඉඩම් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) ඉඩම් ලබා නොදෙන්නේ නම්, ඒ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0405/'08

10.

ගරු අචල ජාගොඩගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0406/'08

11.

ගරු අචල ජාගොඩගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0407/'08

12.

ගරු අචල ජාගොඩගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0526/'08

13.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 සිට 2006 වසර දක්වා එක් එක් වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ආයතන විසින් මිළදී ගනු ලැබූ වී ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) ඉහත එක් එක් වර්ෂයේ මිල දී ගත් වී තොග වලින් සහල් හා වී ලෙස වෙළඳ පොලට නිකුත් කළ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වී සහ සහල් තොග වෙළඳ පොලට නිකුත් කරනු ලැබූ දිනයන් කවරේද;

(iv) ඒ කවර මිල ගණන් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙළඳ පොලට නිකුත් කරනු ලැබූ වී හා සහල් තොග මිල දී ගන්නා ලද පුද්ගලයින් හා ආයතන අදාළ මිල දී ගත් ප්‍රමාණයද සමඟ කවරේද;

(ii) ලබාදෙනු ලැබූ මිල ගණන් හා අදාල දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'08

14.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක් එක් දිස්ත්‍රික්කය සඳහා 2005/06 මහ කන්නය, 2006 යල කන්නය සහ 2006/2007 මහ කන්නය සඳහා සහනාධාර පදනම මත ලබාදෙන ලද පොහොර වර්ග හා ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා රජයට අයත් ලංකා පොහොර සමාගම හා කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙනුවෙන් පත්කරන ලද නියෝජිතයින් කවුරුන්ද;

(ii) අදාළ එක් එක් කන්නයේ දී රජයේ පොහොර සමාගම් දෙක මගින් එම නියෝජිතයින් වෙත ලබාදෙන ලද පොහොර වර්ගය සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී නියෝජිතයිනට ලබාදෙන පොහොර, ගොවීන් වෙත නිකුත් කරන්නේ කවර ආයතන විසින්ද;

(iv) එම නියෝජිතයින් වෙත ලබාදෙන ලද සියලු පොහොර අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත නිදහස්කර තිබේද;

(v) එසේ නොමැතිනම්, ඒ කවර නියෝජිතයින්ද;

(vi) අදාළ ප්‍රමාණය හා නිදහස් නොකිරීමට හේතු කවරේද;

(vii) එම පොහොර ලබා නොදුන් පුද්ගලයින් හා ආයතන වෙත කවර ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

0530/'08

15.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පුද්ගලීකරණය කරන ලද්දේ කවර වර්ෂයේද;

(ii) පුද්ගලීකරණය කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) ටෙන්ඩර් කැඳවනු ලැබුවේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන් වෙන් වෙන්ව කවරේද;

(iv) අදාල සමාගම් තෝරා ගනු ලැබුවේ කවර පදනමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පුද්ගලීකරණය කිරීමේදී සමාගම් කොටස් හි රජය හා එක් එක් ආයතන සඳහා පැවරී ඇති කොටස් ප්‍රමාණය හා ප්‍රතිශතයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පුද්ගලීකරණය කරන ලද වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය සඳහා රජයට ලැබී ඇති ලාභාංශ ප්‍රමාණ වෙන් වෙන්ව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම**

1.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය,— ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; පේෂකර්ම හා නිමි ඇඳුම් කාර්මාන්තය සංවර්ධනය කිරීමට සහ එහි තිරසාරභාවය සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස ද; දේශීය හා විදේශීය ශිෂ්‍යයන් උදෙසා පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය, කළමනාකරණය කිරීම සහ අදාළ ක්ෂේත්‍ර පිළිබඳව පුහුණු පාඨමාලා පැවැත්වීම පිණිස ද; විදේශ රටවල් සඳහා තාක්ෂණික හා උපදේශන සේවා සැපයීම පිණිස ද; 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත සහ 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ. භා. 3.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

ගරු (පූජ්‍ය) කොටපොල අමරකිත්ති හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය.

" ලසන්ත අලගියවන්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— කැලෑ ආඥා පනත යටතේ නියෝග,— කැලෑ ආඥා පනතේ (451 වැනි අධිකාරය වූ) 24 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 මැයි 09 වැනි දින අංක 1548/29 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.22 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*3.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142,— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම |
| | | | පුනරාවර්තන වියදම් රු. 18,000,000 |
| | | | මුළු වියදම රු. 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*5.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 118,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් එක්දහස් එකසිය අසූපන් කෝටි හතලිස් ලක්ෂයකට (රු.1,185,40,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 118 | — | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 03 | — | කෘෂිකාර්මික සංවර්ධනය |
| පුනරාවර්තන වියදම් | | | රු. 1,185,40,00,000 |
| මුළු වියදම | | | රු. 1,185,40,00,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජුලි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 5 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රුපියල් 3,216,180,332.

*6.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

වීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*10.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජුලි 18). [1]

*14.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*15.
සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*16.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*17.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.
නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 වැනි දින අංක 1555/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*20.
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 වැනි දින අංක 1533/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*21.
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 වැනි දින අංක 1534/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*23.
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*24.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*25.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වැනි දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*33.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

34.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.
මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.
රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.
කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
“ පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---